# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/8 — 1976 දෙසැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද — 1976.12.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 11/76.

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 17 දරන ජාතික මෙට්‍රික් පරිවර්තන පනත**

1 වන වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 17 දරන ජාතික මෙට්‍රික් පරිවර්තන පනතේ 1 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වෙළෙඳ අමාත්‍ය ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, ඉහත කී පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම සඳහා නියමිත දිනය වශයෙන් 1977 ජනවාරි මස පළමුවන දිනය, මේ නියමයෙන් නියම කරමි.

ටී. බී. ඉලංගරත්න,
වෙළෙඳ අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 29 වන දින,
කොළඹ දී ය.

12—136

---

එල්. ඩී.—ඕ. 53/73.

**1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත**

1 වන වගන්තිය යටතේ නියමය

1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනතේ 1 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍ය ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම, ඉහත කී පනත ක්‍රියාත්මක වන දිනය වශයෙන් 1977 ජනවාරි මස පළමුවන දිනය මෙයින් නියම කරමි.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 29 වන දින,
කොළඹ දී ය.

12—137

1 A ජ—24424—5,005 (76/12)

### 1963 අංක 11 දරන මුදල් පනත

1971 අංක 55 දරන පනතින් අවසන් වරට සංශෝධිත, 1963 අංක 11 දරන මුදල් පනතේ 120(3) (ඇ) (xi) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ඒ වගන්තිය යටතේ අනුමත කරන ලද නියමය.

නිල් ද අල්විස්,
වැඩබලන මුදල් අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියමය

ශ්‍රී ලංකාවෙහි, ආණ්ඩුවේ කිසියම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම, (අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව හෝ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් හෝ 1971 අංක 35 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ශ්‍රී ලංකාවෙහි ආණ්ඩුව විසින් අත්කර ගන්නා ලද හෝ පවරා ගන්නා ලද යම් වෙළඳ ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම හැර) ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් විය යුතුය.

12—138/1

---

### 1963 අංක 11 දරන මුදල් පනත

1971 අංක 55 දරන පනතින් සංශෝධිත, 1963 අංක 11 දරන මුදල් පනතේ 120(3) (ඇ) (xi) වැනි වගන්තිය යටතේ, මුදල් අමාත්‍යවරයා විසින් කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ඒ වගන්තිය යටතේ අනුමත කරන ලද නියමය.

නිල් ද අල්විස්,
වැඩබලන මුදල් අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියමය

1971 අංක 55 දරන පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 120(3) (ඇ) (xi) වන වගන්තිය යටතේ කරන ලදුව, 1973 පෙබරවාරි 21 වැනි දින අංක 47/1 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

12—138/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.